21-11-2025 **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් සිටින්නේ දේවමය සේවයේය. ඔබ සෑම කෙනෙකුටම සතුට වෙතට යන පාර පෙන්විය යුතු අතර, ශිෂ්‍යත්වයක් දිනා ගැනීමට ඔබ උත්සාහ දැරිය යුතුයි.

**ප්‍රශ්නය:** ඔබගේ බුද්ධිය ඉතා හොඳින් ඥානය ධාරණය කළ විට, ඔය දරුවන්ගේ කුමන භීතියද ඉවත් වන්නේ?

**පිළිතුර:** ඔබ ඥානය ලබා ගත් විට සහ මෙම ඥානය ධාරණය කරගත් විට, භක්ති මාර්ගයේ ඔබගේ ගුරු, ඔබට සාප කිරීම ගැන භීතිය ඉවත්ව යයි, මන්ද, ඥාන මාර්ගයේ කිසි කෙනෙකුට ඔබට සාප කළ නොහැක. රාවන ඔබට සාප කරන නමුත් පරම පියා ඔබට උරුමයක් ලබා දෙයි. ගුප්ත බල හදාරන අය, අන් අයට කරදර කරන අතර අන් අයට දුක් ගෙන දෙන දේවල් කරයි. ඥාන මාවතේදී ඔය දරුවන් සෑම කෙනෙකුටම සතුට ලබා දෙයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙතැන අසුන් ගෙන ඔය සුමිහිරි ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරන්නේ, පළමුවෙන්ම ඔබ සියල්ලන්ම ජීවාත්ම බවයි. ඔබට මෙම ස්ථිර විශ්වාසය තිබිය යුතුයි. ඔබ පරම දනව්වේ සිට පැමිණ, ඔබගේ චරිත කොටස් රඟපෑම සඳහා සිරුරු ගන්නා, ජීවාත්ම බව, ඔය දරුවන්ට වැටහෙයි. චරිත කොටසක් රඟපාන්නේ ජීවාත්මයයි. මනුෂ්‍යයින් සිතන්නේ, චරිත කොටසක් රඟපාන්නේ සිරුර කියාය. විශාලතම වැරැද්ද එයයි. කිසිම කෙනෙක් ජීවාත්මය නොදන්නේ මේ නිසාය. ජීවාත්ම වන අප, පැමිණ, චක්‍රය වටා යන අන්දම, ඔවුන්ට අමතක වී ඇත. පරම පියා පැමිණ, ඔබව ජීවාත්ම අවධානයට පත් කළ යුතුව ඇත්තේ මේ නිසාය. කිසිම කෙනෙක් මෙම දේවල් නොදනී. ජීවාත්ම තම චරිත කොටස් රඟපාන්නේ කෙසේද කියා විස්තර කර දෙන්නේ පරම පියා පමණයි. මනුෂ්‍යයන් උපරිම වශයෙන් උපත් 84 ක්ද අවම වශයෙන් උපත් 1 ක් හෝ 2 ක්ද ගනී. ජීවාත්ම දිගින් දිගටම පුනර්භව ගත යුතුයි. මින් ඔප්පු වන්නේ බොහෝ උපත් ඇති අය, බොහෝ පුනර්භවද ගන්නා බවය. අඩු උපත් සංඛ්‍යාවක් ඇති අය, අඩු පුනර්භව ගනී. නාට්‍යකදී වුවද, ඇතැම් අය ආරම්භයේ සිට අවසානය දක්වාම චරිත කොටසක් රඟපාන අතර තවත් සමහරු කුඩා කොටසක් පමණක් රඟපායි. මනුෂ්‍යයින් මෙය නොදනී. ජීවාත්ම, තමන්ව නොහඳුනන බැවින්, ඔවුන් පරමාත්ම පියාව හඳුනන්නේ කෙසේද? මේ සියල්ල බලපාන්නේ ජීවාත්මයටයි. පරම පියා, ජීවාත්මයන්ගේ පියාය. ජීවාත්මයන්ගේ පියා, ක්‍රිෂ්ණා විය නොහැක. ක්‍රිෂ්ණාට අශාරීරික කෙනා යැයි කිව නොහැක. ඔහුව හඳුනාගත හැකි වන්නේ ශාරීරික ස්වරූපයකින් පමණයි. සෑම මානවයෙක් තුළම ජීවාත්මයක් සිටියි. සෑම ජීවාත්මයක් තුළම චරිත කොටසක් පටිගත වී තිබේ. ඔබ අතරින්ද, මෙම දේවල් විස්තර කළ හැකි අය, ඔබ දරණ උත්සාහයට අනුව, අංකානුරූපයි. ඔය ජීවාත්ම උපත් 84 ක් ගෙන ඇති අන්දම ගැන, ඔය දරුවන්ට දැන් වැටහෙනවා. සෑම ජීවාත්මයක්ම, පරමාත්ම ජීවය නොවෙයි, නැත. ජීවාත්ම වන අප, පළමුව දේවතාවන් වන ආකාරය ගැන පරම පියා විස්තර කර දී ඇත. වර්තමානයේ අපි අපවිත්‍ර සහ තමෝප්‍රධාන් වන අතර, අපි පිවිතුරු සහ සතෝප්‍රධාන් විය යුතුයි. පරම පියා පැමිණෙන්නේ ලෝකය පැරණි වූ විටය. පරම පියා පැමිණෙන්නේ පැරණි ලෝකය අළුත් කිරීමටයි. ඔහු නව ලෝකය ස්ථාපිත කරයි. නව ලෝකයේදී, ආදි සනාතන දෙවි දේවතා ධර්මය තිබේ. පෙර කළ, කලියුගයේ ශුද්‍ර ආගමට අයත් වූ බව ඔබ කියන්නේ ඔවුන් පිළිබඳවයි. ඔබ දැන් ප්‍රජාපිතා බ්‍රහ්මාගේ මුඛයෙන් උපන් නිර්මාණය වන, බ්‍රහ්මණයන් බවට පත් වී ඇත. ඔබ බ්‍රහ්මණ වංශයට පැමිණ ඇත. බ්‍රහ්මණ වංශයට රජ පෙළපතක් නැත. බ්‍රහ්මණ වංශය, රාජධානියක් පාලනය කරන්නේ නැත. මෙකල, බ්‍රහ්මණ වංශයට හෝ ශුද්‍ර වංශයට, භාරතයේ රාජධානියක් නොමැත. ඔවුන් දෙකොටසටම රාජධානියක් නැත. දැන් තිබෙන්නේ මහජනතාව ගෙන් සැදි, මහජනතාවගේ රජයකි. ඔය බ්‍රහ්මණයින්ට රාජධානියක් නැත. ඔබ ඉගෙනගන්නා ශිෂ්‍යයන්ය. ඔබට උපත් 84 හි චක්‍රය බ්‍රමණය වන ආකාරය විස්තර කර දෙන්නේ පරම පියා පමණයි. ස්වර්ණමය, රිදී, තඹ සහ කලි යුග තිබෙන අතර, ඉන්පසුව මෙම සංගම යුගය තිබේ. සංගම යුගයට තිබෙන ප්‍රශංසාව, වෙනත් කිසිම යුගයකට නැත. මෙය වඩාත්ම උසස් සංගම යුගයයි. ඔබ ස්වර්ණමය යුගයේ සිට රිදී යුගයට යන විට, අංශක දෙකක් අඩු වෙයි, එබැවින් ඔබ එය වර්ණනා කරන්නේ කෙසේද? ඔබ පහත් වීමක් වර්ණනා කරන්නේ නැත. මෙම කලි යුගයට කියන්නේ, පැරණි ලෝකය කියාය. දේවතාවන් ගේ රාජධානිය තිබෙන නව ලෝකය, දැන් ස්ථාපිත වීමට යනවා. වැඩියෙන්ම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් ඔවුන්ය. පසුව ක්‍රම-ක්‍රමයෙන් ඔවුන්ගේ අංශක අඩුවන විට, ඔවුන් පහත් වෙයි ඔවුන් ශුද්‍ර බුද්ධි ඇති අය බවට පත් වෙයි. ඔවුන්ට ගල් බුද්ධි ඇති අය යැයිද කියයි. ඔවුන්ගේ බුද්ධි කෙතරම්

ගල් මෙන් වනවාද කියතොත්, ඔවුන් වන්දනා කරන අයගේ ජීවිත කතා වුවද ඔවුන් නොදනී. දරුවන්, ඔවුන්ගේ පියාගේ ජීවිත කතාව නොදන්නේ නම්, ඔහුගෙන් ඔවුන්ට උරුමයක් ලැබෙන්නේ කෙසේද? ඔය දරුවන් දැන් පරම පියාගේ ජීවිත කතාව දන්නවා. ඔබට ඔහුගෙන් උරුමයක් ලැබෙනවා. ඔබ අසීමිත පියාව සිහිපත් කරයි. මෙසේ ගායනා කෙරෙයි 'මවත් පියාත් ඔබ වන අතර, අපට ඔබගෙන් අසීමිත සතුට ලැබෙයි.' එබැවින් පරම පියා අනිවාර්යෙන්ම පැමිණ ඔබට බොහෝ සතුට ලබා දෙන්නට ඇති. පරම පියා පවසන්නේ මා පැමිණ ඔය දරුවන්ට අසීමිත සතුට ලබා දෙනවා. මෙම ඥානය ඔය දරුවන්ගේ බුද්ධියේ ඉතා හොඳින් තිබිය යුතුයි. ඔබ ස්වදර්ශන චක්‍රධාරීන් වන්නේ මේ නිසාය. ඔබට දැන් ඥානයේ තෙවැනි ඇස ලැබී තිබේ. ඔබ නැවත වරක් දේවතාවන් වන බව ඔබ දන්නවා. ඔබ දැන් ශුද්‍රයින්ගෙන් බ්‍රහ්මණයන් බවට පත් වී ඇත. කලි යුග බ්‍රහ්මණයන්ද සිටිනවා නොවේද? එම බ්‍රහ්මණයන් කලි යුගී බැවින්, ඔවුන්ගේ ආගම සහ වංශය ස්ථාපිත වූයේ කවදාද කියා ඔවුන් නොදනී. ඔබ දැන් ප්‍රජාපිතා බ්‍රහ්මාගේ සෘජු දරුවන් වී ඇති අතර, ඔබ අයත් වන්නේ උසස්ම වංශයටයි. පරම පියා මෙතැන අසුන් ගෙන, ඔබට අධ්‍යාපනයක් ලබා දීමේ, ඔබව රැක බලා ගැනීමේ සහ ඔබව සැරසීමේ සේවය කරයි. ඔබද සිටින්නේ දේවමය සේවයේ පමණයි. පරමාත්ම දෙවියන්, පියාණන් පවසන්නේ මා පැමිණ ඇත්තේ ඔය සියලුම දරුවන්ගේ සේවය සඳහාය. මා ඔය දරුවන්ට සතුට වෙතට යන මාවත පෙන්විය යුතුයි. පරම පියා පවසන්නේ දැන් ආපසු නිවසට යන්න! මනුෂ්‍යයන් විමුක්තිය ලබා ගැනීම සඳහා භක්තියේ යෙදෙයි. ඔවුන්ට නිසැකයෙන්ම බන්දන සහිත ජීවිතයක් තිබේ. පරම පියා පැමිණෙන්නේ ඔබව එම සියලු දුකින් මුදවා ගැනීමටයි. අසරණ බවේ විලාප ඇති වන බව, ඔය දරුවන් දන්නවා. අසරණ බවේ විලාපයන්ට පසුව ජයග්‍රහණයේ හඬ ඇසෙයි. ස්වභාවික ව්‍යසන සිදු වන විට, කෙතරම් අසරණකමක් ඇති වෙයිද කියා, දැන් ඔබගේ බුද්ධියේ ඇත. යාදවයන්, එනම් යුරෝපීයයන් සිටියි. යුරෝපීන්ට, යාදවයන් යැයි කියන බව, පරම පියා විස්තර කර ඇත. ආමාශයෙන් මිසයිල මතු වූ ආකාරය සහ ඔවුන් සාප කළ ආකාරය පෙන්වා තිබේ. කෙසේවෙතත්, සාපයක් පළලිබඳ ප්‍රශ්නයක් නැත. මෙය නාටකයකි. පරම පියා උරුමයක් ලබා දෙන අතර රාවන ඔබට සාප කරයි. නාටකය නිර්මාණය කර තිබෙන්නේ මේ අන්දමින්ය. සාප කරන මනුෂ්‍යයන් සිටියි. සාප ඉවත් කර දමන වෙනත් මිනිසුන්ද සිටියි. මිනිසුන් ගුරුන් ආදීන්ට බිය වන්නේ ඔවුන් සාපයක් කරයි කියාය. ඇත්ත වශයෙන්ම ඥාන මාවතේ කිසිම කෙනෙකුට ඔබට සාප කළ නොහැක. ඥාන මාර්ගයේ හෝ භක්ති මාර්ගයේ සාපයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. ගුප්ත බල හදාරන අය සාප කරමින් මිනිසුන්ට බොහෝ දුක් දෙයි. ඔවුන් ඒ අන්දමින් බොහෝ මුදල් උපයා ගනී. බැතිමතුන් එවන් වැඩ නොකරයි. ඔබ සංගම යුගය සමඟ 'වඩාත් ශුභදායක' යන වචනයද ලිවිය යුතු බව, බාබා විස්තර කර ඇත. තවද ඔබ 'ත්‍රි මූර්ති' සහ 'ප්‍රජාපිතා' යන වචනද ලිවිය යුතුයි, මන්ද බොහෝ මිනිසුන්ට 'බ්‍රහ්ම' යන නම තිබෙන නිසා. ඔබ 'ප්‍රජාපිතා' යන නම ලියූ විට, ප්‍රජාවගේ පියා (ප්‍රජාපිතා) ශාරීරික ස්වරූපයෙන් සිටිය යුතු බව ඔවුන්ට වටහා ගත හැක. ඔබ 'බ්‍රහ්ම' කියා පමණක් ලියූ විට, ඔවුන් සිතන්නේ ඔහු සූක්ෂම දේශයේ වැසියෙක් පමණක් බවයි. ඔවුන් බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ට දෙවියන් යැයි කියයි. ඔබ 'ප්‍රජාපිතා' යැයි ලියූ විට, ප්‍රජාපිතා සිටින්නේ මෙහි බව, ඔබට විස්තර කළ හැක. ඔහු සූක්ෂම දේශයේ සිටින්නේ කෙසේද? ඔවුන් විෂ්ණුව පෙන්වා තිබෙන්නේ බ්‍රහ්මාගේ නාභියෙන් මතු වන ආකාරයටයි. ඔය දරුවන්ට ඥානය ලැබී තිබේ. නාභියකින් මතු වීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. බ්‍රහ්මා, විෂ්ණු බවට පත් වන්නේ කෙසේද, එමෙන්ම විෂ්ණු, බ්‍රහ්මා වන්නේ කෙසේද? ඔබට පිංතූර භාවිත කර, මුළු චක්‍රයේ සියලුම ඥානය විස්තර කළ හැක. පිංතූර භාවිත නොකර විස්තර කිරිමට විශාල උත්සාහයක් දැරීමට අවශ්‍යයි. බ්‍රහ්මා, විෂ්ණු වන අතර, විෂ්ණු, බ්‍රහ්මා වෙයි. ලක්ෂ්මි සහ නාරායන්, උපත් 84 හි චක්‍රය වටා ගොස් ඉන්පසුව සරස්වති සහ බ්‍රහ්මා වෙයි. බත්තිය නිර්මාණය කළ විට, මුලදී, බාබා ඔබට නම් දුන්නේය. ඉන්පසු බොහෝ දෙනෙක් පිටව ගියේය. බ්‍රහ්මණයින්ගේ මාලාවක් නිර්මාණය කළ නොහැකි බව කියන්නේ මේ නිසාය. ඔවුන් උත්සාහ දරන්නන් බැවින්, ඔවුන් දිගටම චංචල වෙයි නරක දශා තිබේ. බාබා මැණික් වෙළෙන්දෙක් විය. මුතු මාල ආදිය සාදන අන්දම ගැන ඔහුට අත්දැකීම් තිබේ. බ්‍රහ්මණයන්ගේ මාලාව නිර්මාණය කෙරෙන්නේ අවසානයේදීය. බ්‍රහ්මණයින් වන අප, දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගෙන, දේවතාවන් බවට පත් වනවා. ඉන්පසු, අපි ඉනිමඟ දිගේ පහළට පැමිණිය යුතුයි. එසේ නැත්නම් අපි උපත් 84 ක් ගන්නේ කෙසේද? ඔබට උපත් 84 හි ගිණුමට අනුව මෙය ගණනය කළ හැක. ඔබගේ කාලයෙන් භාගයක් අවසන් වූ පසු, වෙනත් ආගම්වල අය එකතු වෙයි. මාලාවක් නිර්මාණය කිරීමට විශාල උත්සාහයක් අවශ්‍යයි. ඒවා පෙරළී නොයන ආකාරයට, මුතු ඉතා ප්‍රවේසමින් මේසය මත තැබෙයි. ඉන්පසුව ඒවා ඉදිකටුවකින් අමුණයි. ඇතැම් විට, මාලය එතරම් හොඳ නැත්නම් එය කඩා දැමීමට සිදුවෙයි. මෙම මාලාව ඉතාමත්ම විශාලයි. ඔබ ඉගෙනගන්නේ නව ලෝකයට බව, ඔය දරුවන්ට වැටහෙනවා. ඔබ මෙවන් පාඨ නිර්මාණය කළ යුතු බව, බාබා විස්තර කර ඇත අපි, ශුද්‍රයන්ගෙන්

බ්‍රහ්මණයන් බවටත් ඉන්පසුව දේවතාවන් බවටත් පරිවර්ථනය වන ආකාරය, පැමිණ වටහාගන්න. මෙම චක්‍රය ගැන දැනුවත් වීමෙන් ඔබ ලෝක පාලකයන් වෙයි. ඔබ ලෝකයේ අධිපතියන් වෙයි. එවන් පාඨ නිර්මාණය කර, දරුවන්ට උගන්වන්න. බාබා ඔබට බොහෝ ක්‍රම පෙන්වා දෙයි. ඇත්ත වශයෙන්ම ඔබට විශාල වටිනාකමක් තිබේ. ඔබට ප්‍රධාන නළු නිළි චරිත ලැබෙයි. ඔබ දියමන්ති (හීරෝ) මෙන් වී ඉන්පසුව චක්‍රය වටා ගොස්, සිප්පි කටු තරම් නොවටින අය වෙයි. දැන් ඔබට දියමන්තියක් මෙන් වටිනා උපතක් ලැබී ඇති බැවින්, ඔබ සිප්පි කටු පසුපස හඹා යන්නේ ඇයි? ඔබගේ නිවස සහ පවුලේ අය අත්හැරිය යුතු නැත. බාබා පවසන්නේ ඔබගේ පවුලේ අය සමඟ නිවසේ වාසය කරන අතර නෙළුම් මලක් මෙන් පිවිතුරු වන්න. එවිට, ලෝක චක්‍රය පිළිබඳ ඥානය වටහා ගැනීමෙන් සහ දිව්‍යමය ගුණධර්ම ද ධාරණය කර ගැනීමෙන්, ඔබ දියමන්ති මෙන් වෙයි. සැබවින්ම වසර 5000 කට පෙර, භාරතය දියමන්තියක් මෙන් විය. ඔබගේ අරමුණ සහ ඉලක්කය වන්නේ මෙම පිංතූරයයි. ඔබ මෙම පිංතූරයට (ලක්ෂ්මී සහ නාරායන්) බොහෝ වැදගත්කමක් දිය යුතුයි. ප්‍රදර්ශන සහ කලාගාර වල ඔය දරුවන් බොහෝ සේ සේවය කළ යුතුයි. සීඝ්‍ර වේගයකින් සේවය නොකර ඔබ පුරවැසියන් නිර්මාණය කරගන්නේ කෙසේද? මෙම ඥානයට මිනිසුන් සවන් දෙන නමුත්, උසස් තත්ත්වයක් හිමි කරගන්නේ ඉතාම ටික දෙනෙකි. 'කෝටියකින් අතලොස්සක්' යැයි කියැවෙන්නේ ඔවුන් ගැනයි. ශිෂ්‍යත්වයක් හිමි කර ගන්නේ ටික දෙනෙක් පමණයි. පාසැලක සිසුන් 40 ක් හෝ 50 කින්, ශිෂ්‍යත්වයක් දිනාගන්නේ ඇතැම් විට එක් කෙනෙක් පමණයි. සමහරුන්ට ධන ලකුණු (වැඩි ලකුණු) ලැබෙන බැවින් ඔවුන්ටද ශිෂ්‍යත්වයක් ලැබෙයි. මෙහි සිදුවන්නේද එයමයි. ධන ලකුණු තිබෙන බොහෝ දෙනෙක් සිටියි. පබුළු අට සිටින අතර, ඔවුන්ද අංකානුරූපයි. රාජධානියේ සිහසුනේ පළමුවෙන්ම අසුන් ගන්නේ ඔවුන්ය. ඉන්පසුව අංශක ක්‍රම ක්‍රමයෙන් අඩු වී ගෙන යයි. ලක්ෂ්මී සහ නාරායන්ගේ පිංතූරය අංක එකේ එකකි. ඔවුන්ගේ රජ පෙළපතද තිබෙන නමුත් පෙන්වා ඇත්තේ (පළමුවන) ලක්ෂ්මී සහ නාරායන්ගේ පිංතූරය පමණයි. මෙහි පිංතූර අඛණ්ඩව වෙනස් කෙරෙන බව ඔබට වැටහෙයි. ඔවුන්ගේ පිංතූර පෙන්වීමේ ඇති ඵලය කුමක්ද? නම, ස්වරූපය, කාලය සහ ස්ථානය යන සියල්ලම වෙනස් වෙයි. ආධ්‍යාත්මික පියා මෙතැන අසුන්ගෙන ඔය මිහිරිතම ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි. පරම පියා මෙය චක්‍රයකට පෙරද විස්තර කළේය. ක්‍රිෂ්ණා, ගොපළු ගොපලියන්ට ඥානය කියා දුන්නා නොවෙයි. ක්‍රිෂ්ණාට ගොපළු ගොපලියන් නොමැති අතර, ඔවුන්ට ඥානය දෙන්නේද නැත ඔහු ස්වර්ණමය යුගයේ රජකුමරෙකි. ඔහු එහිදී රාජයෝගාව උගන්වන්නේ හෝ අපවිත්‍ර අයව පිවිතුරු කරන්නේ කෙසේද? ඔබ දැන් ඔබගේ පරම පියා සිහිපත් කළ යුතුයි. පරම පියා, ගුරුවරයා ද වෙයි. ශිෂ්‍යයන්ට කිසිදාක ඔවුන්ගේ ගුරුවරයා අමතක කළ නොහැක. දරුවන්ට ඔවුන්ගේ පියා හෝ ගුරුව අමතක කළ නොහැක. ඔවුන්ට උපතේ සිට පියෙක් සිටියි. ඔවුන්ගේ වයස අවු 5 වූ පසුව ගුරුවරයෙක් ලැබෙන අතර ඔවුන්ගේ විශ්‍රාමික තත්ත්වයට පත් වූ විට ගුරු කෙනෙක් හදාගනී. උපතේදීම ගුරු කෙනෙක් සිටීමෙන් ඵලයක් නැත. ඔවුන් ගුරු කෙනෙක් හදාගෙන පසුදින මිය යැමට වුවද පුළුවනි. එවිට ගුරු කුමක් කරන්නද? මෙසේද ගැයෙයි සත්ගුරු නොමැතිව ඔබට විමුක්තිය ලබාගැනීමට නොහැක. කෙසේවෙතත්, ඔවුන් සත්ගුරුව පසෙකට දමා, ගුරු කෙනෙක් හදාගනී. බොහෝ ගුරුන් සිටියි. බාබා පවසන්නේ දරුවනි, ඔබට කිසිම භෞතික ගුරු කෙනෙක් හදා ගැනීමට අවශ්‍ය නැත. ඔබ කිසි කෙනෙකුගෙන් කිසි දෙයක් නොඉල්ලිය යුතුයි. මෙවැනි කියමනකි යමක් ඉල්ලනවාට වඩා මිය යන එක හොඳයි! තම මුදල් මාරු කර හරින්නේ කෙසේද කියා සැම කෙනෙක්ම සිටින්නේ කණස්සල්ලෙනි. ඔවුන් දෙවියන්ගේ නාමයෙන්, තම මතු භවය වෙනුවෙන් දන් දී, මෙම පැරණි ලෝකයේදී එහි තාවකාලික ප්‍රතිලාභයක් ලබා ගනී. මෙහිදී ඔබගේ සැම දෙයක්ම උපත් 21 කට නව ලෝකයට මාරු කර යැවෙයි. ඔබගේ සිරුර, මනස සහ ධනය පරමාත්ම දෙවියන්ට කැප කළ යුතුයි. එය සිදු කළ හැකි වන්නේ ඔහු පැමිණි විට පමණයි. කිසි කෙනෙක් පරමාත්ම දෙවියන්ව නොහඳුනන බැවින්, ඔවුන් ගුරු කෙනෙක්ව අල්ලා ගනී. ඔවුන්ගේ ධනය ආදිය, එම ගුරුට පුදයි. ඔවුන්ට උරුමකරුවෙක් නොමැති විට, ඔවුන් සැම දෙයක්ම ඔවුන්ගේ ගුරුට දෙයි. මෙකල, කිසි කෙනෙක් දෙවියන්ගේ නාමයෙන් වුවත් කිසි දෙයක් නිති පතා නොදෙයි. පරම පියා විස්තර කරන්නේ මම, දුප්පතුන්ගේ ස්වාමියාය, මා භාරතයට පැමිණෙන්නේ මේ නිසාය. මා පැමිණ, ඔබව ලෝකයේ අධිපතියන් බවට පත් කරවනවා. යමක් ඍජුව කිරීමෙන් සහ වක්‍රව කිරීම අතර විශාල වෙනසක් තිබේ. ඔවුන් කිසිම දෙයක් නොදන්නා නමුත්, දෙවියන්ගේ නාමයෙන් කැප වන බව නිකම්ම පවසයි. ඒ සියලු දේ අරුත් රහිතයි. ඔය දරුවන්ට දැන් වැටහීම ලැබී තිබේ. එබැවින් නුවණ නැති අයගෙන් ඔබ නුවණ ඇති අය බවට පත් වී ඇත. පරම පියා විශ්මයන් සිදු කරන්නේ කෙසේද කියා ඔබගේ බුද්ධිය දන්නවා. ඔබට සැබවින්ම අසීමිත පියාගෙන් අසීමිත උරුමයක් ලැබෙයි. ඔබට දාදා ගේ මාර්ගයෙන්, පරම පියාගෙන් උරුමයක් හිමි වෙයි. දාදා ද ඔහුගෙන් උරුමයක් හිමි කරගන්නවා. උරුමයක් ලබා දෙන්නේ ඔහුම පමණයි. ඔබ සිහි කළ

යුත්තේ ඔහු පමණයි. පරම පියා පවසන්නේ දරුවනි, මා පැමිණ මෙම කෙනාගේ බොහෝ උපත් වල අවසන් උපතේදී ඔහු තුළට ඇතුළු වී, ඉන්පසුව ඔහුව සුරංගනාවක් කිරීමට ඔහුව පිවිතුරු කරන්නෙමි. ඔබට බැජ් එක භාවිත කරමින් බොහෝ සේවය කළ හැක. ඔබගේ සියලුම බැජ් බොහෝ අරුත්බරයි. මෙම පිංතූරය, ඔබට ජීවිත දානය ලබා දෙන එකකි. කිසි කෙනෙක් එහි වටිනාකම නොදනී. ඕනෑම කෙනෙකුට දුර තියාම ඒවා පැහැදිලිව කියවිය හැකි වන සේ, බාබා සෑම විටෙකම කැමති, විශාල දේවල් වලටයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරම පියාගෙන් අසීමිත උරුමයක් හිමි කර ගැනීම සඳහා, නුවණැත්තෙක් වී, ඔබගේ සිරුර, මනස සහ ධනය, පරම පියාට සෘජුව කැප කරන්න. ඔබට ඇති සෑම දෙයක්ම උපත් 21 කට මාරු කර හරින්න.
2. ඔබට අධ්‍යාපනයක් දීමේ, රැක බලාගැනීමේ සහ සැරසීමේ සේවය, පරම පියා කරයි. එබැවින් පියා කරන එම සේවයම සිදු කරන්න. සෑම කෙනෙක්ම ඔවුන්ගේ බන්දන දිවියෙන් මුදවා, ජීවන මුක්තියට රැගෙන යන්න.

**වරදානය:** පිපාසිත ජීවාත්මයන්ගේ පිපාසාව සංසිඳලන්නට, ඔබ මෙම දැනුමේ පුන්කළස අත දරන්නෙක් වේවා.
ජීවාත්ම බහුතරයක්, පදාර්ථයන්ගේ තාවකාලික පහසුකම් ගැන, ආධ්‍යාත්මික සාමය අත්විඳීමට නිර්මාණය කර ඇති සීමිත ස්ථාන ගැන සහ අන් අයට දෙවියන්ව මුණගැසීමට සලස්වන බව පවසන අය ගැන, විඩා පත්වී ඇත. ඔවුන් විඩාවට සහ අධෛර්යයට පත්වී සිටියි. සත්‍යය යනු, වෙනත් දෙයක් බව ඔවුන් විශ්වාස කරයි; ලැබීම් වෙනුවෙන් ඔවුන් පිපාසාවෙන් සිටියි. ජීවාත්ම සහ පරමාත්ම දෙවියන් පිළිබඳ හැඳින්වීමේ සත්‍ය බිඳිති වලට එවන් පිපාසාවෙන් පෙළෙන ජීවාත්ම තෘප්තිමත් කළ හැක. එබැවින් එවන් පිපාසිත ජීවාත්මයන්ගේ පිපාසාව සංසිඳලීමට මෙම දැනුමේ පුන්කළස අතදරන්න. නිරන්තරයෙන් මෙම අමෘතයේ පුන්කළස ඔබ සමග තබා ගන්න. අමරණීය වී අන් අයවත් අමරණීය කරවන්න.

**පාඨය:** ඔබගේ ඉලක්කයට තමන්ව හැඩ ගසා ගැනීමේ අරමුණ තබා ගන්න, එවිට ඔබ පහසුවෙන් අංගසම්පූර්ණත්වයට පත් වෙයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: අශාරීරික ස්ථිතියේ පුහුණුව වැඩි කරන්න(අශාරීරි සහ විදේහි).**

අශරීරික වීමට ඔබට අසුරා ගැනීමේ බලය අත්‍යවශ්‍ය වේ. ඔබ ශරීර අවධානය පිළිබඳ ඕනෑම සිතිවිල්ලක් සහ මෙම භෞතික ලෝකයේ අහිතකර තත්ත්වයන් පිළිබඳ සිතිවිලි අසුරා තැබිය යුතුය. ආපසු නිවසට යෑමේ සිතිවිල්ල තිබීම හැර, වෙනත් කිසිදු සිතිවිල්ලක ව්‍යාප්තිය ඇති කර නොගන්න. ඔබ දැන් ආපසු නිවසට යෑම පිළිබඳ සිතිවිල්ල පමණක් තබා ගන්න. ජීවාත්මයක් වන ඔබ, අහස් පදාර්ථයට ඔබ්බෙන් පියාසර කරන බව අත්විඳින්න. මේ සඳහා, දැන් අමරණීය සිංහාසනයේ වාඩි වී සිටීමේ පුහුණුව වැඩි කරන්න.